# SBS ව්‍යවහාර සංග්‍රහය පිළිබඳව

SBS යනු **අපේ ප්‍රඥප්තියෙහි** දක්වා ඇති පරිදි ඕස්ට්‍රේලියානු ප්‍රජාවට වගකියන, ස්වාධීන ජාතික පොදු රූපවාහිනී, ගුවන්විදුලි, සහ ඩිජිටල් මාධ්‍ය සේවයකි. අපට ඕස්ට්‍රේලියානු රජය මගින් සහ ප්‍රචාරණය වැනි වාණිජමය ආදායම් මගින් මුදල් ලැබේ.



අපේ ජාලය හරහා සුවිශේෂ ඕස්ට්‍රේලියානු කතාන්තර කීම, දෙස් විදෙස් පුවත් සහ කාලීන තොරතුරු, ක්‍රීඩා, අන්තර්ජාතික නාට්‍ය සහ වාර්තාමය වැඩසටහන්, ආහාර, චිත්‍රපට, සහ ප්‍රාදේශීය ගුවන්විදුලි සේවා 60 කට අධික භාෂා වලින් අපි බෙදාහදාගනිමු. ප්‍රථම ජනතාවගේ කතාන්තර පැවසීමේ නිවහනද අප වන අතර, ජාතික ආදිවාසී රූපවාහිනිය (NITV) වැඩසටහන් ඉදිරිපත් කරන්නේ ආදිවාසී කාචයකින් දකින ආකාරයටයි.

අපගේ අන්තර්ගතය ප්‍රජාවේ අපේක්ෂාවන් සපුරන බව සහතික කරණු සඳහා, රූපවාහිනිය, ගුවන්විදුලිය, මාර්ගගතව හෝ සමාජ මාධ්‍ය යන කවර ආකාරයකින් වුවද ඔබ ලබාගන්නා සියලුම SBS අන්තර්ගතය පිළිබඳව, අප සතුව ඇති SBS ව්‍යවහාර සංග්‍රහය, නීති සහ ප්‍රමිතීන් පනවා ඇත.

## ව්‍යවහාර සංග්‍රහය මෙබඳු වැදගත් කාරණා ආවරණය කරයි...

### විශ්වාසය

**අප විශ්වාසදායක සහ අදාල අන්තර්ගතයන් සපයන ආකාරය**

- අපි අපගේ අන්තර්ගතය පිළිබඳව ස්වාධීන තීරණ ගන්නෙමු.
- අපගේ ආරංචි සහ කාලීන පුවත් වල අන්තර්ගතය නිවැරදිය, සමබර සහ අපක්ෂපාතීය, එමෙන්ම මහජනයාගේ ප්‍රයෝජනය සඳහා වේ.
- අපි සවිස්තරාත්මක දැක්මක් හා අදහස් පරාසයක් අනුගමනය කරමු - අපේ අන්තර්ගතය නවෝත්පාදක සහ අභියෝගාත්මක මෙන්ම මතභේදාත්මක සහ ප්‍රකෝපකාරී ද වියහැකියි.

### විනිවිදභාවය

**ඔබගේ අන්තර්ගතය තෝරාගැනීම සඳහා මඟපෙන්වීමට අප උපකාර කරණ ආකාරය**

- ඔබට, ඔබේ දරුවන්ට සහ ඔබේ භාරයේ සිටින තරුණ පුද්ගලයින් හට සුදුසු අන්තර්ගතය තෝරාගැනීමට හැකිවනු පිණිස අපි තොරතුරු සපයන්නෙමු.
- ප්‍රචාරණයන් අපේ අන්තර්ගතයෙන් වෙනස්වන බව සහතික කරනු පිණිස සමහර ප්‍රචාරණයන් ඉදිරිපත්කරණ ආකාරය පිලිබඳ නීති සකසා ඇත.
- දැඩි පීඩාවක් ඇති විය හැකි අන්තර්ගතයක් ඇතිවිට, අපි එය නැරඹීමට ඉඩ ඇති ප්‍රේක්ෂකයින් පිළිබඳව සිතා, එහි සංවේදී බව සළකා, සුදුසු පරිදි අනතුරු අඟවා, සංස්කරණමය වශයෙන් අදළ නම් පමණක් එම තොරතුරු ප්‍රදර්ශනය කරන්නෙමු.

### ගෞරවය

**අප ගෞරවය දක්වන සහ උනන්දු කරවන ආකාරය**

- අපි අදළ කාරණය සැලකිල්ලට ගෙන, පූර්ව විනිශ්චය සහ සාධාරණීකරණය කළ නොහැකි ආකෘතිකයන් ද ඇතුළුව, වෙනස්කම්කිරීම් වලට උනන්දු කරවන අන්තර්ගතයෙන් වැළකෙමු.
- අපි ඉංග්‍රීසි නොවන භාෂාවලින් අන්තර්ගතය ඉදිරිපත් කර විශාල පරාසයක මත ඉදිරිපත් කිරීමට උනන්දු කරමු.
- ආදි වාසීන් පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීමේදී අපි සංවේදී වන අතර ආදි වාසීන්ගේ සහ ටොරෙස් දූපත් වාසීන්ගේ සංස්කෘතික චර්යාධර්මවලට අනුකූලව කටයුතු කරමු.
- අපි මිනිසුන්ගේ පෞද්ගලිකත්වයට ගරු කරණ අතර, අපගේ වාර්තාකිරීමේ වගකීම් වලට අනුව සමබරව කටයුතු කරමු.

### වගවීම

**අප වගකියන ආකාරය**

- අපගේ අන්තර්ගතය සහ සේවා පිළිබඳව ප්‍රශංසාත්මක හෝ විවේචනාත්මක ප්‍රතිචාර දැක්වීමට ක්‍රමවේදයන් අපි ඔබටලබාදෙමු.
- පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා අපට ව්‍යවහාර සංග්‍රහය යටතේ ස්වාධීන ක්‍රියා පිළිවෙතක් ඇති අතර එය SBS දුග්ගන්නාරාල ගේ පරීක්ෂාවට භාජනය වේ.




SBS

**වැඩිදුර සොයන්න**

sbs.com.au/aboutus/sbs-code-of-practice